**වැල්වැටිතුරේ නගර සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුලි 15 දින හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 31 දින සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, වැල්වැටිතුරේ නගර සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවලින් මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදි මූලධන කාර්යයන් 03ක් ආරම්භ නොකළ නමුත් රු. 675,000 ක් වියදම් ණයහිමියෝ ගිණුමට මාරුකිරීම නිසා බැරකම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණු අතර සමුච්චිත අරමුදලත් අඩුවෙන් දක්වා තිබුණි. | නොවැලැක්විය හැකි හේතුන් නිසා කාර්යයන් ආරම්භ කර නොතිබුණි. | මූලධන කාර්යයන් ආරම්භ නොකර වියදම් ණයහිමියෝ ගිණුමේ ඇතුළත් කළ වටිනාකම ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුවේ. |

### 1.4 අනුකූල නොවීම

#### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) නගර සභා ආඥා පනතේ VI පරිච්ඡේදයේ 157 වගන්තිය 6(උ) ඡේදය | රු. 53,150 ක අනුමැතිය රහිත දැන්වීම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අයකිරීමට කටයුතු කරමින් පවතී. | පනත ප්‍රකාරව නියමිත කාලය තුළ ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | නගර සභා මූල්‍ය රීති මාලාවේ III පරිච්ඡේදයේ 54 (3) වගන්තිය | හිඟ වරිපනම් බදු රු. 5,736,117 ක් ගෙවීම් පැහැර හැරී පුද්ගලයන්ට වරෙන්තු නිකුත් කර නොතිබුණි. | හිඟ වරිපනම් බදු අයකිරීමට කටයුතු කරමින් පවතී. | නගර සභා මූල්‍ය රීතීන්වලට අනුකූලව ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහ යේ මුදල් රෙගුලාසි 371 | සභාව විසින් ලබාදුන් අත්තිකාරම් රු.85,000ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල අනුමැතිය ලැබූ වහාම නිරවුල් කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 13,625,211ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 5,733,352 ක් විය. මේ අනුව, පසුගිය වර්ෂය සමග සැසඳීමේදි ප්‍රවර්තන වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,891,859කින් වර්ධනය වී තිබුණි.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,737,379 | 5,185,295 | 5,736,117 | 2,406,500 | 1,727,713 | 4,538,640 |
| කුලී | 3,652,100 | 4,432,052 | - | 2,873,850 | 3,700,781 | 47,000 |
| බලපත්‍ර ගාස්තු | 729,100 | 745,250 | - | 734,500 | 716,355 | - |
| වෙනත් ආදායම් | 66,859,690 | 55,351,110 | 5,196,616 | 50,362,500 | 47,264,939 | 11,617,089 |
| | 75,978,269 | 65,713,707 | 10,932,733 | 56,377,350 | 53,765,238 | 16,202,729 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හිඟ වරිපනම් බදු රු. 5,210,372 ක් අයකර ගැනීම සඳහා සභාව විසින් නියමිත ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ හිටි මුදල් අයකර ගැනීමේ ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවති. | හිඟ හිටි මුදල් නියමිත කාලයේදී අයකර ගත යුතු වේ. |

**2.2.3** **බලපත්‍ර ගාස්තු**

---------------

**කර්මාන්ත බලපත්‍ර ගාස්තු**

-------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සන්නිවේදන කුළුණු බලපත්‍ර ගාස්තු සහ ඉදිකිරීමේ ගාස්තු රු. 10,000 ක් සභාව විසින් අයකර ගෙන නොතිබුණි. | අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | නියමිත කාලයේදී හිඟහිටි මුදල් අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වේ. |

**2.2.4** **මුද්දර ගාස්තු**

-------------

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු රු. 278,836 ක් ලැබිය යුතුව තිබුණි. | ලබාගැනීමට කටයුතු කරමින් පවතී. | නියමිත කාල පරාසය තුළ හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

-------------------------

**3.1** **කාර්යසාධනය**

---------------

මහනගර සභා ආඥා පනතේ 4 වැනි වගන්තිය අනුව, මහජන සෞඛ්‍යය, මහජන උපයෝගීතා සේවාවන් සහ පොදු මංමාවත් සහ මහජන සුවය පහසුකම් සහ සුභසාධනය ආදී සභාවෙන් ඉටුකළ යුතුව තිබූ කාර්යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**අතුරු ව්‍යවස්ථා**

----------------

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභා ආඥා පනතේ 157 වගන්තිය ප්‍රකාරව මූලික කරුණු 15 ක් පිළිබඳව අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කළ යුතු වුවත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් මූලික කරුණු 05ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා සකස් කර තිබුණි. | අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු සිදු කළ යුතු වේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ස්ථාවර තැන්පතු රු. 62,220,310 ක් නගර සංවර්ධන අරමුණු සඳහා උපයෝජනය නොකර පොලී ආදායම් ඉපැයීමේ අරමුණින් බැංකුවේ තැන්පත් කර තිබුණි. | ඝන අපද්‍රව්‍ය ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වූ ඉඩම් මිලදී ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | තැන්පතු මුදල සංවර්ධන අවශ්‍යතා සඳහා උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) සුසාන භූමි 05 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමටත් ඒ සඳහා බදු අයකිරීමටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නගර සභාවට නීතිමය වශයෙන් පවරාදීමෙන් පසුව බදු අයකිරීම සඳහා ක්‍රියාමාර්ගයන් ගනු ලැබේ. | සුසාන භූමිවල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව විසින් මානව සම්පත් විධිමත්ව ලබාගෙන නොයෙදවීම නිසා එවැනි මානව සම්පත් 10 ක් විසින් ඉටු කළයුතු සේවාවන් ප්‍රමාදවී තිබුණු බව විගණනයේදි නිරීක්ෂණය වි තිබුණි. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කරමින් පවතී. | නියමිත කාලය තුළ තනතුරු පුරප්පාඩු පිරවීමට සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වේ. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) තීරුවිල් උද්‍යානය ප්‍රතිසංස්කරණය සඳහා ගෙවූ රු.214,605 ක් නිරවුල් කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | මේ දක්වා අදාළ මුදල් නිදහස් කර නොතිබුණි. | නිරවුල් කිරීම නියමිත කාලය තුළ ගෙවීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) අදාල බලධාරීන්ගෙන් වෙළෙඳ බලපත්‍ර ලබා නොගෙන සත්ව ගොවිපළ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් 2017 වර්ෂයේ සිට නඩු විභාග වෙමින් පවතින නමුත් මේ සම්බන්ධ වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍යප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට අවශ්‍ය වි නොතිබුණි. | සභාවට එරෙහිව පවතින නඩු සම්බන්ධයෙන් අසම්භාව්‍ය බැරකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාවට එරෙහිව ඉඩම් සම්බන්ධයෙන් 2002 වර්ෂයේ සිට නඩු 02ක් විභාග වෙමින් පවතින නමුත් මේ සම්බන්ධ වියදම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ප්‍රතිපාදන වෙන්කර, වියදම් අදාල වියදම් ශීර්ෂවලට ඇතුළත් කිරීම නිසා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | නඩු සම්බන්ධයෙන් අසම්භාව්‍ය බැරකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 පවරා නොගත් වත්කම්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | වාහනයක් සභාවේ නමට අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහනය ආපසු භාරදීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | නියමිත කාලය තුළ සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ආ) | රු. 6,600,000 ක්වූ ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | නව ලිපිලේඛන ලබාගැනීමට කටයුතු කරමින් පවතී. | නියමිත කාලය තුළ අයිතිය මාරුකිරීමට කටයුතු කළ යුතුවේ. |

**3.5.2 නිෂ්කාර්ය වත්කම්**

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහජන උද්‍යානයක් ඉදිකිරීම සඳහා 2013 වර්ෂයේ බදු ලබාගත් ඉඩමේ මේ දක්වා උද්‍යානය ඉදිකර නොතිබූ අතර සභාව විසින් බදු ගාස්තු ලෙස රු. 298,800 ක් ගෙවා තිබුණි. | අපේක්ෂිත අරමුදල් නොලැබීම නිසා උද්‍යාන ඉදිකිරීමේ ව්‍යාපෘතිය ප්‍රමාද වී තිබුණි. | ව්‍යාපෘතියක් සැලසුම් කිරීමේදී ඒ සඳහාවූ අරමුදල් මූලාශ්‍ර හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | නව වෙළඳපොල ගොඩනැගිලි සංකීර්ණයේ කඩ කාමර 11 ක් සහ විවෘත මණ්ඩපය කුලියට ලබා දී නොතිබූ නිසා නගර සභාවට ආදායම් අහිමි වී තිබුණි. | වෙනත් කාර්යයන් සඳහා භාවිතා කිරීමට සැලසුම් කර යෝජනා ඉදිරිපත් කරමින් පවතී. | සභාව විසින් ඉදිකළ කඩකාමර සංකීර්ණය භාවිතා කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ඇ) | දීර්ඝ කාලයක සිට භාවිතා නොකර පවතිනා ට්‍රැක්ටරය සහ ට්‍රැක්ටර් බවුසරය අළුත්වැඩියා කිරීමට හෝ විකිණීමට කටයුතු කර නොතිබුණි. | මේ සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබේ. | භාවිතා නොකරන වාහන සම්බන්ධයෙන් නියමිත කාලය තුළ සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ අයවැය ඇස්තමේන්තු වියදම් හා තථ්‍ය වියදම් අතර ප්‍රමාණාත්මක විචලනයක් නිරීක්ෂණය වීම නිසා මෙය ඵලදායී නොවූ අයවැයක් ලෙස දක්නට ලැබුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | අයවැය විධිමත් අයුරින් සැලසුම් කිරීමට උචිත ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

### 4.2 නොවිසඳූ නිරීක්ෂණ සහ පිළිතුරු නොලත් විගණන විමසුම්

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් රජයේ ගිණුම් කාරක සභාව විසින් විමර්ශනය කළ විගණකාධිපතිවරයාගේ 2012, 2013 වර්ෂ සඳහා විගණන වාර්තා පිළිබඳ නිරීක්ෂණයන් සම්බන්ධයෙන් කිසිඳු පියවරක් මේ දක්වා ගෙන නොතිබුණි. | ක්‍රියාමාර්ගයන් අප විසින් ගෙන කාලයෙන් කාලයට සම්බන්ධිත පාර්ශවයන්ට වාර්තා නිකුත් කර තිබුණි. | විගණන විමසුම්/ පළාත් රජයේ ගිණුම් කාරක සභාවේ වාර්තා සම්බන්ධයෙන් නියමිත ක්‍රියාමාර්ග ගත යුතුවේ. |